# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## එකතු කළ අගය මත බදු (සංශෝධන)

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

මුදල් අමාත්‍යතුමා විසින් 2016 ජූලි මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 ජූනි මස 24 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[123 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 16.00 යි. තැපැල් ගාස්තුව : රු. 15.00 යි.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

**2 වන වගන්තිය :** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු සංශෝධන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, 2016 මැයි 2 වන දින සිට බලපැවැත්වෙන පරිදි බදු අනුප්‍රමාණය සියයට පහළොව දක්වා වැඩි කිරීම වේ.

**3 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, තොග සහ සිල්ලර වෙළඳාමට ලබා දී තිබූ බදු නිදහස් කිරීම් ඉවත් කිරීම වේ.

**4 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, 2016 ජනවාරි මස 1 වන දින සිට 2016 ජනවාරි මස 13 වන දින දක්වා බදු ඉන්වොයිස් පත්‍ර නිකුත් කර නොමැති සහ වෙනත් අනුප්‍රමාණවලින් බදු ගෙවා ඇති සැපයීම සම්බන්ධයෙන් සේවා සැපයුම් වටිනාකම සැලසීම වේ.

**5 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, බද්දට යටත් සේ සැළකෙන බදු වගකීම ඉවත් කිරීම වේ.

**6 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, එකතු කළ අගය මත බදු වගකීම ලියාපදිංචි කිරීම සඳහා බද්දට යටත් සීමාව මාස තුනක් සඳහා මිලියන තුනක් සහ වසරක් සඳහා මිලියන දෙළහක් දක්වා අඩු කිරීම සහ තොග සහ සිල්ලර වෙළඳාම ලියාපදිංචි කිරීමට අදාළ ආනුෂංගික සංශෝධන වේ.

**7 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, වාර්තාවක් නිසි වාර්තාවක් ලෙස සැලකීම සඳහා අතිරේක තොරතුරු සැපයීම සඳහා විධිවිධාන සැලසීම වේ.

**8 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, බදු සඳහා මුල්‍ය සේවා ලියාපදිංචිය සම්බන්ධයෙන් බද්දට යටත් සීමාව මාස තුනක කාලයක් සඳහා මිලියන 3 දක්වා අඩු කිරීම වේ.

**9 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25ආ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, වාර්තාව සැපයීමේ කාලසීමාව මාස දෙළහක් කිරීමට අදාළ විධිවිධාන සැලසීම සහ එයට අදාළ ආනුෂංගික විධිවිධාන වේ.

**10 වන වගන්තිය:** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය 25ආ වගන්තියට කළ සංශෝධනයට ආනුෂංගික වේ.

**11 වන වගන්තිය:** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඊ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මුල්‍ය සේවා සම්බන්ධයෙන් වන අර්ථ නිරූපණය පුළුල් කිරීම වේ.

**12 වන වගන්තිය:** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අන්තර්ජාලය මගින් (on-line) සිදුකරන ලියාපදිංචි කිරීම සඳහා සහ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය යටතේ වන ක්‍රියාකාරකම් සඳහා ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම සඳහා දක්වා දණ්ඩන විධිවිධාන පුළුල් කිරීම වේ.

**13 වන වගන්තිය:** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මැයි මස 2 වන දින සිට බලාත්මක වන පරිදි අන්තර්කාලීන ගැළපීම් ඉවත් කිරීම වේ.

**14 වන වගන්තිය:** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස සංශෝධනය කරනු ලබන අතර, එමගින් 2016 අයවැය යෝජනාවලට අනුකූලව නිශ්චිත බදු නිදහස් කිරීම් ඉවත් කිරීම වේ.

# එකතු කළ අගය මත බදු (සංශෝධන)

එල්.ඩී.—ඕ. 27/2016

## 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2016 අංක      දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එහි ඇතැම් වගන්ති බලාත්මක විය යුතු දිනයන් එම වගන්තිවල නිශ්චිතව දක්වා ඇත්නම් මිස, 2016 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.*

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

*2002 අංක 14 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (iii) වන අයිතමයේ, "සියයට දොළහක අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/28 ක් වේ); සහ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "සියයට දොළහක අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/28 ක් වේ);" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (iv) වන අයිතමයේ, "2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට"2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන සහ 2016 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙරාතුව අවසන්වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සහ, 2016 අප්‍රේල් මස 1 වන දින ආරම්භව 2016 මැයි මස 1 වන දිනෙන් අවසන්වන කාලසීමාව සඳහා; සහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (iv) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

2—PL 010021—425 (2016/06)

"(v) 2016 මැයි මස 2 වන දිනයෙන් ආරම්භව 2016 ජූනි මස 30 වන දිනයෙන් අවසන්වන කාලසීමාව සඳහා සහ, 2016 ජූලි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සියයට පහළොවක අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/23 ක් වේ).".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් භාණ්ඩ තොග හෝ සිල්ලර වශයෙන් කරන සැපයීම් සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "2016 මැයි මස 2 වන දිනයට පෙරාතුව වූ කාලසීමාව සඳහා යම් භාණ්ඩ තොග හෝ සිල්ලර වශයෙන් කරන සැපයීම් සම්බන්ධයෙන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (13) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(14) 2016 ජනවාරි මස 1 වන දිනසිට 2016 ජනවාරි මස 31 වන දින දක්වා වන කාලසීමාව සඳහා, යම් ලියාපදිංචි තැනැත්තකු විසින් බදු ඉන්වොයිස්පත්‍රයක් හැර වෙනත් ඉන්වොයිස්පත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, සැපයීම් වටිනාකම,

(i) සියයට එකොළහක අනුප්‍රමාණය නොවන යම් අනුප්‍රමාණයකට බදු එකතු කර ඇති අවස්ථාවක දී -

(අ) යම් භාණ්ඩ සපයනු ලබන අවස්ථාවක, වටිනාකම, සම්පූර්ණ ඉන්වොයිස් වටිනාකම 200/297 න් ගුණ කිරීමෙන් ලැබෙන මුදල් ප්‍රමාණයට සමාන වන බවට සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) යම් සේවාවක් සපයනු ලබන අවස්ථාවක, වටිනාකම, සම්පූර්ණ ඉන්වොයිස් වටිනාකම 100/99 න් ගුණ කිරීමෙන් ලැබෙන මුදල් ප්‍රමාණයට සමාන වන බවට සලකනු ලැබිය යුතු ය.

(ii) කිසිදු බදු මුදලක් එකතු කර නොමැති අවස්ථාවක, වටිනාකම, බදු ඇතුළත් ප්‍රතිෂ්ඨාව සහ සියයට එකොළහක අනුප්‍රමාණයෙන් බදු මුදල බැහැර කිරීමෙන් පසුව ලැබෙන අගයට සමාන වන බවට සලකනු ලැබිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ පළමුවන අතුරු විධානයේ "එම ලියාපදිංචි තැනැත්තාගේ බද්දට යටත් සැපයුම් ලෙස සලකනු ලැබිය යුතු අතර," යන වචන වෙනුවට "2016 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ යම් කාලසීමාවක් සඳහා එම ලියාපදිංචි තැනැත්තාගේ බද්දට යටත් සැපයුම් ලෙස සලකනු ලැබිය යුතු අතර," යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ දෙවන අතුරු විධානයේ "එසේ ම තවදුරටත්," යන වචන වෙනුවට "එසේ ම තවදුරටත්, 2016 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ යම් කාලසීමාවක් සඳහා," යන වචන ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ -

(i) (iv) වන ඡේදයේ "2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු," යන වචන සහ ඉලක්කම් වෙනුවට "2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2016 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) එහි (iv) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(v) 2016 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ශ්‍රී ලංකාව තුළ යම් බදු අයකළ හැකි ක්‍රියාකාරකමක් කරනු ලබන හෝ කරගෙන යනු ලබන්නා වූ යම් තැනැත්තකු විසින් -

(අ) අවස්ථාවෝචිත පරිදි, යම් බදු අය කළ හැකි එක් මාසයක හෝ මාස තුනක කාලසීමාව අවසානයේ දී, අවස්ථාවෝචිත පරිදි, එම එක් මාසයක හෝ මාස තුනක

කාලසීමාව ඇතුළත එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාවේ දී කරන ලද භාණ්ඩ හෝ සේවා හෝ, භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන තුනක් වේ නම්; හෝ

(ආ) එවකට අවසන් වන මාස දොළහක කාලසීමාව තුළ දී, එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාව තුළ කරන ලද බදු අයකළ හැකි භාණ්ඩ හෝ සේවා, හෝ භාණ්ඩ සහ සේවාවල බදු අයකළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන දොළහක් ඉක්මවා ඇත්නම්; හෝ

(ඇ) යම් අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඉදිරියේ දී එළඹෙන එක් මාසයක හෝ මාස තුනක බදු අයකළ හැකි කාලසීමාව තුළ එම තැනැත්තාගේ ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන තුනක් ඉක්මවීමට ඉඩ ඇති බවට හෝ ඉදිරියේ දී එළඹෙන බදු අය කළ හැකි මාස දොළහක කාලසීමාව සඳහා රුපියල් මිලියන දොළහක් ඉක්මවීමට ඉඩ ඇති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම්,

එම තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය.''.

(iii) එම වගන්තියේ (1) වන උපවගන්තියේ පළමුවන අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන්:-

"එසේම තවදුරටත්, (v) වන ඡේදයේ කාර්ය සඳහා, ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය 2016 මැයි මස 2 වන දින සිට බලපැවැත්වෙන පරිදි පැන නැගිය යුතු ය.".

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන එහෙත් 2016 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) "එවැනි සෑම වාර්තාවක් ම නිශ්චිත ආකෘතියෙන් විය යුතු අතර, ඒ ආකෘතියේ දැක්වීමට නියමිත සියලු විස්තර එහි ඇතුළත් විය යුතු ය." යන වචන වෙනුවට "එවැනි සෑම වාර්තාවක් ම එම සියලු විස්තර ඇතුළත් එම ආකෘතියෙහි සහ කොමසාරිස්-ජනරාල්වරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි අදාළ උපලේඛන ද සමග විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :-

"(1අ) ස්වකීය සැපයීම් පිළිබඳ, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අදාළ උපලේඛන ද සමග එම සියලු විස්තර එම ආකෘතියෙහි අන්තර්ගත වාර්තාවක් ඉදිරිපත් කර නොමැති සෑම ලියාපදිංචි තැනැත්තකු ම, මේ පනතේ කාර්ය සඳහා සැපයීම් පිළිබඳ වාර්තාවක් සපයා නොමැති තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(1ආ) යම් ලියාපදිංචි තැනැත්තකු විසින්, යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දින හෝ එදිනට පෙරාතුව ස්වකීය සැපයීම් පිළිබඳ වාර්තාවක් සපයනු ලබන සහ (1අ) උපවගන්තිය යටතේ ඔහු විසින් වාර්තාවක් සපයා නොමැති බවට සලකනු ලබන අවස්ථාවක, සහකාර කොමසාරිස්වරයා විසින්, එම බදු අය කළ හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එළඹෙන මාසයේ අවසාන දිනයේ සිට දින දාහතරක් ඉකුත් වීමට පෙරාතුව එම ලියාපදිංචි තැනැත්තා විසින් ඉදිරිපත් කොට ඇති වාර්තාව, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අදාළ උපලේඛන සහ එම සියලු විස්තර එම ආකෘතියෙහි අන්තර්ගත නොවන බැවින් එය නිසි වාර්තාවක් නොවන බව දන්වමින් එම තැනැත්තා වෙත නිවේදනයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(1ඇ) යම් ලියාපදිංචි තැනැත්තකු වෙත (1ආ) උපවගන්තිය යටතේ නිවේදනයක් ලැබී ඇති අවස්ථාවක දී, එම ලියාපදිංචි තැනැත්තා විසින් එම නිවේදනය ලැබී දින දාහතරක් ඇතුළත, එම වාර්තාව නිසි වාර්තාවක් බවට පත් කිරීමට අවශ්‍ය වන්නා වූ අදාළ උපලේඛන සහ එම සියලු විස්තර ඇතුළත් එම ආකෘතියෙහි වන නිසි වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, ඉන්පසුව (1අ) උපවගන්තියේ විධිවිධාන එම වාර්තාව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(1ඈ) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, වලංගු වාර්තාවක් ලෙස සලකනු ලැබිය හැකි නිසි වාර්තාවක් ලැබීමෙන් පසුව පමණක් සහකාර කොමසාරිස්වරයා විසින් එම වාර්තාව ලැබීම පිළිගනු ලැබිය යුතු ය.

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "නියමිත ආකෘති පත්‍රය මත වාර්තාවක් සපයන ලෙස" යන වචන වෙනුවට "අදාළ උපලේඛන සහ එම සියලු විස්තර අන්තර්ගත වන එම ආකෘතියෙහි වන වාර්තාවක් සපයන ලෙස" යන වචන ආදේශ කිරීමෙන්''.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ, "2015 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2015 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2016 මැයි මස 2 වන දිනයට පෙරාතුව" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; හෝ

(2) එම උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඈ) එම සැපයීම්වල වටිනාකම, අවස්ථාවෝචිත පරිදි, මාස තුනක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන තුනක් ඉක්මවන අවස්ථාවක හෝ මාස දොළහක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන දොළහක් ඉක්මවනු ලබන අවස්ථාවක දී, එම ලියාපදිංචිය 2016 මැයි මස 2 වන දින හෝ එදිනට පසුව වූ යම් කාලසීමාවක් සඳහා සිදු වූයේ නම්.".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 25ආ වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) එම උපවගන්තියේ (අ) ඡේදයේ "2011 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා එක් මාසයක් විය යුතු ය; සහ" යන වචන සහ ඉලක්කම් වෙනුවට

"2011 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා එක් මාසයක් විය යුතු ය;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (ආ) ඡේදයේ "2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා මාස හයක් විය යුතු ය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන එහෙත් 2016 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන්වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා මාස හයක් විය යුතු ය; සහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) එම වගන්තියේ (ආ) ඡේදයේ අතුරු විධානයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඇ) 2016 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා මාස දොළහක් විය යුතු ය;"

(ඈ) එම උපවගන්තියේ අතුරු විධානය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"එසේ වුව ද, යම් නිශ්චිත ආයතනයක් හෝ වෙනත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට,

(i) 2016 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා, එම නිශ්චිත ආයතනයේ

හෝ තැනැත්තාගේ ගිණුම් මාර්තු මස 31 වන දිනයෙන් අවසන්වන මාස දොළහක කාලසීමාවක් සඳහා සකස් කර ඇති අවස්ථාවක, මාස හයක කාලසීමාව, අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ විය හැකි අතර, මාස දොළහක කාලසීමාව ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ විය හැකි ය; සහ

(ii) 2016 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන බදු අය කළ හැකි යම් කාලසීමාවක් සඳහා, එම නිශ්චිත ආයතනයේ හෝ තැනැත්තාගේ ගිණුම් මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන මාස දොළහක කාලසීමාව සඳහා සකස්කර ඇති අවස්ථාවක, මාස දොළහක කාලසීමාව අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ විය හැකි ය;

(iii) මාර්තු මස 31 වන දිනයෙන් අවසන්වන කාලසීමාව සඳහා ගිණුම් සකස්කර ඇති අවස්ථාවක, ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා කොමසාරිස්- ජනරාල්වරයාගේ අනුමතය ඇතිව එම වෙනස්වීම සිදු වන අවස්ථාවේ දී වෙනම වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.''.

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(2) සෑම ලියාපදිංචි නිශ්චිත ආයතනයක් සහ වෙනත් යම් තැනැත්තකු විසින් එක් එක් බදු අය කළ හැකි කාලසීමාව සම්බන්ධයෙන්-

(අ) එම බදු අය කළ හැකි කාලසීමාව 2016 ජනවාරි මස 1 වන දිනයෙන් අවසන්වන බදු අයකළ හැකි කාලසීමාවක් වේ නම්, බදු අයකළ හැකි කාලසීමාවට පසුව එළඹෙන මාසය අවසන්වීමට පෙරාතුව; සහ

(ආ) එම බදු අය කළ හැකි කාලසීමාව 2016 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන බදු අය කළ හැකි කාලසීමාවක් වේ නම්, එම බදු අය කළ හැකි කාලසීමාවට ඉක්බිතිව ම එළඹෙන මාස හයක කාලයක් ඇතුළත,

නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ වාර්තාවක් සපයනු ලැබිය යුතු ය.

(2අ) (අ) එම ආකෘතියට සාරානුකූල නොවන වාර්තාවක් සපයනු ලබන හෝ 25ඇ වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති සෑම මාස හයකදී ම අතුරු ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීම පැහැර හරින හෝ කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන පරිදි වාර්තාවේ අන්තර්ගතය හෝ අතුරු ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීම පැහැර හරින සෑම ලියාපදිංචි තැනැත්තකුම, මේ පනතේ කාර්ය සඳහා මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත්කොට නොමැති තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) යම් ලියාපදිංචි තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා හෝ යම් මාස හයක කාලසීමාවක් සඳහා මේ වගන්තියේ සහ 25ඇ වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දින හෝ එදිනට පෙර මූල්‍ය සේවා පිළිබඳ එකතු

කළ අගය මත බදු පිළිබඳ වාර්තාවක් හෝ අතුරු ඇස්මේන්තුවක් ඉදිරිපත් කරනු ලබන සහ, 25ආ වගන්තියේ (2අ) උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන යටතේ මූල්‍ය සේවා පිළිබඳ එකතු කළ අගය මත බදු වාර්තාවක් ඉදිරිපත් කොට නොමැති ලෙස සලකනු ලබන අවස්ථාවක, තක්සේරුකරු හෝ සහකාර කොමසාරිස්වරයා විසින්, එම බදු අය කළ හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එළඹෙන මාසයේ අවසාන දිනයේ සිට දින තිහක කාලයක් ඉකුත්වීමට පෙර, එම තැනැත්තා විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව හෝ අතුරු ඇස්තමේන්තුව කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන අදාළ උපලේඛන ද සමග එම සියලු විස්තර එම ආකෘතියෙහි අන්තර්ගත නොවන බව එම තැනැත්තා වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ යම් ලියාපදිංචි තැනැත්තකු වෙත තොරතුරු ලැබෙන අවස්ථාවක, එම ලියාපදිංචි තැනැත්තා විසින් එම තොරතුරු ලැබී දින තිහක කාලයක් ඇතුළත, ඉදිරිපත් කරන ලද වාර්තාව නිසි වාර්තාවක් බවට පත්කිරීමට අවශ්‍ය වන්නා වූ අදාළ උපලේඛන සහ එම සියලු විස්තර ඇතුළත් එම ආකෘතියෙහි වන නිසි වාර්තාවක් කොමසාරිස්-ජනරාල්වරයා වෙත සපයනු ලැබිය යුතු අතර, ඉන්පසුව එම වාර්තාව සම්බන්ධයෙන් (අ) ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ,

(අ) "ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගෙන" යන වචන වෙනුවට "ආර්ථිකයේ යහපත සහ ඉඩ දිය හැකි ක්ෂයවීමේ ඒකාකාරී බව පවත්වාගෙන යාම සැලකිල්ලට ගෙන" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (1) වන උපවගන්තියේ අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අතුරු විධානය ආදේශ කිරීමෙන්:-

"එසේ වුව ද,

(අ) 2016 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා, බදු අය කළ හැකි එක් එක් කාලසීමාව සඳහා ලාභ මුදල් ප්‍රමාණය නිසැකව සොයා ගත නොහැකි අවස්ථාවක, එම ලාභ මුදල් ප්‍රමාණය ලබා ගත හැකි තොරතුරු මත පදනම්ව තක්සේරු කළ හැකි ය. තක්සේරු කරන ලද ප්‍රමාණය විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග වාර්ෂික පදනමක් මත තථ්‍ය මුදල් ප්‍රමාණය පිළිඹිඹු වන පරිදි සකස් කර ගත යුතු අතර, එම සකස් කිරීම, අදාළ ගිණුම් කාලසීමාව වැසීමේ දිනයට පසු මාස හයක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය; සහ

(ආ) 2016 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා, මාසික ගෙවීම් වෙනුවෙන් මාසික ලාභ නිවැරදිව සොයා ගත නොහැකි අවස්ථාවක, එම ප්‍රමාණය ලබා ගත හැකි තොරතුරු මත පදනම්ව තක්සේරු කළ හැකි අතර, සෑම ලියාපදිංචි නිශ්චිත ආයතනයක් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් ම බදු අය කළ හැකි කාලසීමාවේ එක් එක් මාස හයක කාලසීමාව සම්බන්ධයෙන් නිශ්චිත ආකෘතියෙහිවන අතුරු ඇස්තමේන්තුවක් ඒ එක් එක් මාස හයක කාලසීමාවෙන් පසුව එළඹෙන මාසයේ අවසානයට පෙරාතුව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.''.

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඉ) 2015 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන එහෙත් 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව සියයට එකොළහක් විය යුතු ය;"; සහ

(ආ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඊ) 2016 මැයි මස 2 වන දිනයෙන් ආරම්භ වන කාලසීමාව සඳහා සියයට පහළොවක් වියයුතු ය.".

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ,

(අ) එහි (උළ) ඡේදයේ "උපදින ලාභ හෝ ආදායම" යන වචන වෙනුවට "(ව්‍යාපාරයකින් උපයන ලාභයක් නොවන) උපදින ලාභ හෝ ආදායම" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"මේ උපවගන්තියේ කාර්ය සඳහා, මූල්‍ය සමාගමක් විසින් සපයන සේවාවලට සමාන සේවාවක් සපයන, එහෙත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී නොමැති තැනැත්තකු" යන්නට, "ස්වකීය ව්‍යාපාරය හෝ ස්වකීය ව්‍යාපාරයේ කොටසක් විසින් තමා වෙනුවෙන් හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන්, තැන්පතු ආකාරයෙන් හෝ ණයකර හෝ බැඳුම්කර ආකාරයෙන් හෝ වෙනත් යම් ආකාරයෙන් මුදල් පිළිගනු ලබන සහ ඒ මත වන පොලී, ලාභ හෝ වට්ටම් ගෙවීම්වලින් සමන්විත වන සහ පොලිය ලබා ගැනීම සඳහා ණය සපයනු ලබන යම් තැනැත්තකු හෝ සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඊ වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඊ වගන්තිය, එහි (ඌ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(එ) යම් විදුලි සංදේශ සේවාවක් හෝ යම් ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් මගින් මුදල් පිළිගැනීම, දැරීම හෝ පැවරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය, එහි (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඇ) අන්තර්ජාලය මගින් (on-line) සිදු කරන ලියාපදිංචි කිරීම් සඳහා ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම, ලියාපදිංචිය සඳහා සාවද්‍ය තොරතුරු උඩුගත කිරීම හෝ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය යටතේ අවසර දෙන ලද ඉලෙක්ට්‍රොනික ලිපිගොනු පද්ධතිය යටතේ සාවද්‍ය ලිපි ලේඛන ඉදිරිපත් කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ සැපයුම බදු අය කළ හැකි සැපයුමක් බවට ඉන් අනතුරුව යම් අවස්ථාවක පත් වුවහොත්," යන වචන සහ ඉලක්කම් වෙනුවට "2016 මැයි මස 2 වන දිනයට පෙරාතුව යම් කාලසීමාවක් සඳහා ඒ සැපයුම බදු අය කළ හැකි සැපයුමක් බවට ඉන් අනතුරුව යම් අවස්ථාවක පත් වුවහොත්," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන ආකාරයෙන් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ කොටසේ (අ) ඡේදයේ,

(අ) (xix) වන අයිතමයේ (ඉ) අනු අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඉ) 2011 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන, එහෙත් 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව විදුලි සංදේශ උපකරණ;";

(ආ) (xx) වන අයිතමය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(xx) 2011 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන, එහෙත් 2016 මැයි මස 2 දිනට පෙරාතුව, විදුලි සංදේශ කර්මාන්තය සඳහා ම පමණක් පාවිච්චි කිරීම සඳහා ආනයනය කරනු ලබන හෝ මිල දී ගනු ලබන බවට හඳුනාගත් සහ විදුලි සංදේශ සේවා ක්‍රියාකරුවකු විසින් ආනයනය කරනු ලැබූ හෝ මිල දී ගන්නා ලද විදුලි සංදේශ කර්මාන්තය සඳහා වූ යම් යන්ත්‍රෝපකරණ හෝ අධිතාක්ෂණික උපකරණ;";

(ඇ) (xxv) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(xxv) - විදුලි සංදේශ කර්මාන්තය සඳහා වූ තඹ කම්බි රැහැන්, ශ්‍රී ලංකාවේ ලබා ගැනීමට නොමැති අවස්ථාවක, 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව ආනයනය කරන ලද එම තඹ කම්බි රැහැන්; හෝ

- 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව දේශීය නිෂ්පාදකයකුගෙන් මිල දී ගනු ලැබූ විදුලි සංදේශ කර්මාන්තය සඳහා වූ තඹ කම්බි රැහැන්;";

(2) ඒ කොටසේ (ආ) ඡේදයේ-

(අ) (xii) වන අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(xii) 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව සෞඛ්‍යාරක්ෂක සේවා සපයන වෛද්‍ය ආයතන විසින් හෝ එම සේවා සපයනු ලබන වෘත්තීය වශයෙන් සුදුසුකම්ලත් තැනැත්තන් විසින් සපයනු ලබන සියලු සෞඛ්‍යාරක්ෂක සේවා;";

(ආ) (xxxi) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(xxxi) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත යටතේ විදුලි සංදේශ බද්දට යටත්වන්නා වූ විදුලි සංදේශ සේවා සහ, 2016 මැයි මස 2 වන දිනයට පෙරාතුව "විදුලි සංදේශ සේවා" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි එම බදු වගකීමෙන් විශේෂයෙන් බැහැර කරන ලද සේවාවන්;";

(ඇ) (xxxv) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(xxxv) 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත මගින් පිහිටුවන ලද විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දේශීය විදුලි සංදේශ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර නිකුත් කිරීමේ සේවාවන්;";

(3) ඒ කොටසේ (ඊ) ඡේදයේ (ii) වන සහ (iii) වන අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ii) රටෙහි ආර්ථික ප්‍රතිලාභය සැලකිල්ලට ගෙන, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් හඳුනාගෙන ඇති, රජය විසින් බදු දරන්නා වූ,

(අ) 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව යම් විශේෂිත ව්‍යාපෘතියක් සඳහා, අනුමත කරන ලද; හෝ

(ආ) නිවාස ව්‍යාපෘතියක් වන්නා වූ, යම් විශේෂිත ව්‍යාපෘතියක් සඳහා, 2016 මැයි මස 2 වන දින හෝ එදිනට පසුව අනුමත කරන ලද

භාණ්ඩ හෝ සේවාවන්.";

(iii) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ හෝ එසේ ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සලසා ඇති පළාත් සභා මගින් පනවා ඇති අදාළ ප්‍රඥප්ති යටතේ ලියාපදිංචිකොට ඇති යම් සමිතියක් හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචිකොට ඇති ලක් සතොස මගින් 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව සපයනු ලබන භාණ්ඩ හෝ සේවා.";

(4) ඒ කොටසේ (ඕ) ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (අ) අනුඡේදයේ (i) අයිතමයේ "ශීර්ෂ අංක යටතේ හඳුනාගත්," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ශීර්ෂ අංක යටතේ හඳුනාගත්, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වන එකතු කළ අගය මත බද්ද, 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත යටතේ වන ජාතිය ගොඩනැගීමේ බද්ද සහ ආනයනය කරනු ලබන අවස්ථාවේ දී පනවනු ලැබිය හැකි වෙනත් යම් නීතියක් යටතේ පනවනු ලබන වෙනත් යම් බද්දක් වෙනුවට පනවා ඇති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (ආ) අනුඡේදයේ "1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වන එකතු කළ අගය මත බද්ද, 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත යටතේ වන ජාතිය ගොඩනැගීමේ බද්ද සහ ආනයනය කරනු ලබන අවස්ථාවේ දී පනවනු ලැබිය හැකි වෙනත් යම් නීතියක් යටතේ පනවනු ලබන වෙනත් යම් බද්දක් වෙනුවට පනවා ඇති 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත"යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ ඡේදයේ (ඇ) අනුඡේදයේ "නිෂ්පාදනය කිරීමේ දී නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්දට යටත්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "නිෂ්පාදනය කිරීමේ

දී, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ එකතු කළ අගය මත බද්ද සහ 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත යටතේ ජාතිය ගොඩනැගීමේ බද්ද වෙනුවට නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්දට යටත්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**වලංගුභාවය.**

**15.** 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව, මේ පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය සටහන් කරනු ලබන දිනයෙන් අවසන් වන යම් කාලසීමාවක් ඇතුළත, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එකතු කළ අගය මත බදු රැස්කිරීමට බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් නිසි අධිකාරි බලය සහිතව ක්‍රියාකර ඇති ලෙස සහ එම බදු එකතුකිරීම වලංගු ලෙස සිදු කර ඇති හා සිදුව ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම බදු එකතු කිරීම සම්බන්ධයෙන් උද්ගත විය හැකි සියලු සිවිල් හෝ අපරාධ නඩුවලින් එම තැනැත්තා මෙයින් හානිපූරණය කරනු ලැබේ:

එසේ වුව ද, ඉහත කී කාලසීමාව තුළ දී, මේ පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට එකතු කරන ලද යම් බදු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ගනු ලැබූ තීරණයක් හෝ නියෝගයක් සම්බන්ධයෙන් යම් අධිකරණයක විභාග වෙමින් පවතින යම් නීති කෘත්‍යයක් සඳහා ඉහත කී විධිවිධාන බලනොපෑ යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**16.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.